**ඇලහැර ප්‍රාදේශීය සභාව - 2022**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඇලහැර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඇලහැර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුව ගිවිසුම් අවලංගු කළ ව්‍යාපෘතිවල නිම් ප්‍රතිශතය පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශනවලට හඳුනා නොගැනීමෙන් ගොඩනැගිලි ඉදිකිරීම් 5 ක වටිනාකම රු.19,241,649 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිමැවුම් ප්‍රතිශතය මත පදනම්ව කෙරීගෙන යන වැඩ, වත්කම් ලෙස සටහන් කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයන්හි EG 3.1 අනුව පවත්නා වත්කම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරණ ලද රු.8,926,938 ක වියදම ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | දක්වා ඇති වියදම් වත්කම් වැඩිදියුණු කිරීම සඳහාවන බැවින් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දියබෙදුම සතිපොළ කඩ කාමර 16 හි පසුව හඳුනාගත් ගොඩනැගිලි වටිනාකම රු.11,688,658 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | ස්ථාවර වත්කම් සඳහා සිදුකරන වැඩිදියුණු කිරීම් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | මාර්ගයක කුට්ටිගල් ඇතිරීම හා බෝක්කුවක් සෑදීම වෙනුවෙන් වූ පිරිවැය වටිනාකම රු.4,974,060 ක් වුවත්, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ රු.5,566,724 ක් ලෙස රු.592,664 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | බිල්පත් අනුව වටිනාකම ගිණුම්ගත කර නොමැති බව නිරීක්ෂණය විය. නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |

## 1.6.2 නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ජංගම නොවන වත්කම් උපලේඛනයන්හි දක්වා ඇති වටිනාකම් සහ ඊට අදාල ස්ථාවර වත්කම් ලේඛනවල දක්වා ඇති වටිනාකම් අතර රු.378,544 ක නොසැසඳීමක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි වටිනාකම හඳුනාගෙන අනුරූපී වාර්තා හෝ ලේඛන නිවැරදි කළ යුතුය. |
| (ආ) | සටහන් අංක 19 අනුව කෙටිකාලීන ගෙවිය යුතු දෑ වල වටිනාකම හා ඊට අදාළ උපලේඛන අනුව වූ වටිනාකම් අතර රු.1,220,669 ක නොසැසඳීමක් විය. | -එම- | -එම- |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති ලැබිය යුතු ව්‍යාපාර බදු, කුලී හා උසාවි දඩ ආදායම් වලට අදාළ උපලේඛන හා ලෙජර් ගිණුම් ශේෂ අතර රු.2,732,400 ක නොසැසඳීමක් විය. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම්/ පූර්ව කාල පරිච්ඡේද වල වැරදි ලෙස සමුච්චිත අතිරික්තයෙන් රු.2,077,173 ක් අඩුකර තිබුණද, පූර්ව කාලඡේදයේ වැරදි සඳහන් උපලේඛන අනුව එම වටිනාකම රු.1,770,851 ක් වූයෙන් රු.306,322 ක නොසැසඳීමක් විය. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ වැඩසටහන් අංක 07 ට අදාළ මුළු වියදම රු.6,528,105 ක් වුවද, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ එම වටිනාකම රු.5,859,012 ක් වූයෙන් රු.669,093 ක නොසැසඳීමක් විය. | -එම- | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ උපලේඛන අනුව පුස්තකාල පොත් වටිනාකම රු. 2,599,427 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු. 3,814,051 ක් වූයෙන් රු.1,214,624 ක නොසැසඳීමක් විය. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ මංමාවත්, බෝක්කු හා පාලම් ක්ෂය උපලේඛන අනුව රු. 4,661,276 ක් වුවද, ගිණුම්ගත කර තිබූ ක්ෂය ප්‍රමාණය රු.5,824,754 ක් වූ බැවින් රු.1,163,478 ක නොසැසඳීමක් විය. | -එම- | -එම- |

### 1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 69,494,416 ක් වටිනා ගිණුම් විෂයයන් 04 කට අදාළව ශේෂ සනාථ කිරීම්, උපලේඛන, උපයෝගී පොත් ඉදිරිපත් නොවීම මත විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය. | නිසි පරිදි යාවත්කාලීන කර 2023 වර්ෂයේ සිට පවත්වාගෙන යන ලෙසට උපදෙස් ලබාදුන් බව. | ශේෂ තහවුරු කරගැනීමට අවශ්‍ය තොරතුරු පවත්වාගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) රීති හා ප්‍රඥප්ති විධිවිධාන** | | | |
| 2018 අගෝස්තු 29 දිනැති අංක 2086/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රාදේශීය සභා සඳහා ප්‍රකාශිත රීති අංක 1.1 | එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් සංයුක්ත ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකු විසින් ප්‍රාදේශීය සභාවේ රාජකාරි ගමන් සඳහා දැරිය යුතු ඉන්ධන සීමාව මසකට ඩීසල් ලීටර් 400 කට නොවැඩි ප්‍රමාණයක් විය යුතු නමුත්, මාස හතකදී සීමාව ඉක්මවා අතිරේක ඉන්ධන ඩීසල් ලීටර් 1,034 ක් භාවිතා කර තිබුණි. | දිස්ත්‍රික්කයෙන් පිටත ධාවනය කිරීම සඳහා අමතර ඉන්ධන ලබාගෙන ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| **(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ** | | | |
| 2022 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 364(3) හි 05 | අවස්ථා 04 කදී රු 133,524 ක එකතු කළ අගය මත බදු ගෙවීම් කර තිබුණද, ඒ පිළිබඳ දේශීය ආදායම් කොමසාරිස්වරයාට දැනුම් දී නොතිබුණි. | එකතු කළ අගය මත බද්ද ගෙවීම් පිළිබඳ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දන්වා පරික්ෂා කර ගෙවීමට | -එම- |

| | | |
|---|---|---|
| | කටයුතු කිරීමට උපදෙස් ලබාදුන් බව. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයභාරය ඉක්මවූ වියදම රු.5,172,484 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්ම වූ වියදම රු.14,043,160 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,781,498 | 1,936,107 | 1,515,898 | 420,209 | 1,547,528 | 1,712,542 | 1,477,562 | 955,542 |
| (ii) | කුලී | 34,495,000 | 3,838,015 | 641,796 | 3,196,219 | 8,951,200 | 9,013,981 | 6,939,800 | 6,240,659 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 745,250 | 1,914,662 | 1,451,042 | 463,620 | 547,750 | 337,830 | 446,275 | 30,000 |
| (iv) | වෙනත් ආදායම් | 29,259,936 | 30,015,271 | 14,391,738 | 15,623,533 | 22,000,000 | 18,000,960 | 26,859,275 | 10,419,246 |
| | | 66,281,684 | 37,704,055 | 18,000,474 | 19,703,581 | 33,046,478 | 29,065,313 | 35,722,912 | 17,645,447 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| 2004 වර්ෂයෙන් පසුව වරිපනම් තක්සේරු කර නොතිබූ අතර, එම තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු අයකිරීම සිදුකර තිබුණි. | නව තක්සේරුව සඳහා මේ වන විට තොරතුරු ලබා ගනිමින් පවතින බව. | කාලීනව වරිපනම් තක්සේරු කළ යුතුය. |
| **(ආ) කුලී** | | |
| කඩ කාමර සම්බන්ධව ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබීම හේතුවෙන් හිඟ කුලී මුදල් වර්ෂ 03 කට අධික කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි. | හිඟ ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ආදායම් රු.13,796,187 ක් හා මුද්දර ගාස්තු ආදායම් රු.1,686,900 ක් විය. | පිළිතුරු ලබාදී නැත. | ලැබිය යුතු මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **අත්හැර දැමූ කර්තව්‍යයන්** | | |
| පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ගිවිසුම්ගත වටිනාකම රු. 19,807,679 ක් වූ කර්තව්‍යයන් 03 ක් ආරම්භ කර ඒ සඳහා රු. 4,130,061 ක් වැය කර තිබූ නමුත් එම ව්‍යාපෘති ඉටුකිරීම අත්හැර දමා තිබුණි. | 03/2022 අංක දරන චක්‍රලේඛ යටතේ රාජ්‍ය වියදම් පාලනය කිරීම හේතුවෙන් අවලංගු කිරීමට කටයුතු සිදුකර ඇති බව. | සභාව විසින් ප්‍රමුඛතාවයන් අනුව ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දියබෙදුම පැරණි සතිපොළ භූමියේ වෙළඳපොළ ගොඩනැගිල්ලක් ඉදිකිරීම අදාළ කොන්ත්‍රාත්කරු විසින් පැහැර හැර තිබූ අතර, ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන තිබූ කොන්ත්‍රාත්කාර ආයතනය 2021 දෙසැම්බර් 07 දින සහිතව සභාව වෙත ලබාදී තිබුණු රු.1,774,889 ක කාර්යයසාධන සුරක්ෂණය සහ රු.7,099,554 ක අත්තිකාරම් සුරක්ෂණ ව්‍යාජ ඒවා වීම හේතුවෙන් සභාවට ඒවා මුදල් කරගැනීමට නොහැකි වී ඇත. එසේම මුල් ගිවිසුම් වටිනාකම රු.35,497,770 ක් වූ මෙම ව්‍යාපෘතියේ වැඩ සඳහා මුල් | ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධව පොලිස් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, අයකර ගැනීමට ඇති ශේෂයන් සම්බන්ධව අවසාන වාර්තාව අනුව එම ආයතනය වෙත ඇති පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වෙනත් ව්‍යාපෘති වල මුදල් ප්‍රතිපාදන වලින් මෙම පාඩුව ගෙවීමට ආයතනය එකඟ වී ඇති බව. | ගිවිසුම්ගත වීමට පෙර අදාළ ලිපිලේඛනවල නිරවද්‍යතාවය තහවුරු කරගැනීමෙන් පසු ගිවිසුම්ගත වී ගෙවීම් කළ යුතුය. |

කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු මුදල රු.12,088,813 ක් වූ අතර, ඉතිරි වැඩ සඳහා මිළ වැඩිවීම් මත ඇස්තමේන්තු වටිනාකම රු.56,338,901 ක් විය.

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක ණය** | | |
| ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතුව සිට වැඩතහනම් වූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.129,677 ක වටිනාකමක් හා සේවය අතහැර ගිය නිලධාරීන් හතරදෙනෙකුගෙන් රු.20,530 ක වටිනාකම ක් වූ ආපදා ණය හා උත්සව අත්තිකාරම්, අවුරුදු 02 ත් අවුරුදු 09 ත් අතර කාලයක සිට අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ සේවක ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන (ප්‍රාග්ධන) යටතේ රු.19,807,676 ක ගිවිසුම් වටිනාකමක් සහිත ව්‍යාපෘති 03 ක් ආරම්භ කර ඇති අතර, 2021.12.31 දින වන විට මෙම ව්‍යාපෘති සඳහා රු.3,725,110 ක් ගෙවා ඇතත්, ගිවිසුම් අවලංගු කර තිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ගේ එකඟතාවය මත ගිවිසුම් අවලංගු කර ඇති බවත්, ව්‍යාපෘති වල ඉදිරි වැඩ නිම කිරීමට අදාලව 2023 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කර පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බව. | සියලු ව්‍යාපෘති අදාළ කාල පරිච්ඡේදය තුළ නිම කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **කාර්යය මණ්ඩල උපයෝජනය**<br>ප්‍රාදේශීය සභාවේ ද්විතියික මට්ටමට අයත් සංවර්ධන නිලධාරි පුරප්පාඩු 04 ක්, කළමනාකරණ සහකාර පුරප්පාඩු 01 ක්, හා තාක්ෂණික නිලධාරි තනතුර හා ප්‍රාථමික මට්ටමට අයත් කාර්ය මණ්ඩල පුරප්පාඩු 09 ක් පැවතුණි. | මේ පිළිබඳ ත්‍රෛමාසිකව යොමුකරන කාර්ය මණ්ඩල පුරප්පාඩු තොරතුරු වාර්තාව මගින් දන්වා ඇති බව. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ යුතුය. |